**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**

**2017 අප්‍රේල් - ජූනි**

**මානවශාස්ත්‍ර පීඨය**

**ප්‍රතිබිම්බ කලා - IMAT – E 2025**

**ලෝක සිනමාව පිළිබඳ ගවේෂණය**

**ප්‍රශ්න <u>පහකට</u> (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. චලන චිත්‍රය බිහිවීමට මග පෑදූ අත්හදා බැලීම් හා පර්යේෂණ පිළිබඳ විමසීමක් කරන්න.

02. චිත්‍රපට මාධ්‍යයෙන් කතන්දරයක් කීමට ජෝර්ජ් මේලීස් අනුගමනය කළ උපක්‍රම මොනවාදැයි පැහැදිලි කරන්න.

03. "එඩ්වින් එස් පෝටර්ගේ චිත්‍රපට, එතෙක් නිපැයුණු අනෙකුත් නිහඬ චිත්‍රපටවලට වඩා දියුණු පියවරක් පෙන්නුම් කරයි." විමසන්න.

04. ඇමරිකානු නිහඬ සිනමාවේ හාස්‍යජනක (comedy) චිත්‍රපට නිෂ්පාදනය පිළිබඳ විස්තරයක් කරන්න.

05. මොන්ටාජ් සංස්කරණ රීතිය හඳුන්වා දෙමින් චිත්‍රපට භාෂාව දියුණුවට පත් කළ සෝවියට් සිනමාකරුවකුගේ නිර්මාණ දායකත්වය අගයන්න.

06. රොබට් ෆ්ලැහර්ටිගෙන් හා ජෝන් ග්‍රියර්සන්ගෙන් වාර්තා සිනමාවේ ප්‍රභවයට හා ප්‍රගතියට ඉටු වූ මෙහෙය පිළිබඳ විමසීමක් කරන්න.

07. ඉතාලියානු නව තාත්ත්විකවාදී (Neo - Realism) සිනමාව බිහිවීමට තුඩු දුන් පසුබිම පැහැදිලි කොට, එකී සිනමා කෘතිවල කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න.

08. වම් ඉවුරේ කණ්ඩායම යනුවෙන් හැඳින්වුණු ප්‍රංශ නවරැල්ලේ (French new wave) සමාරම්භක සිනමාකරුවන් හඳුන්වා දී, ඔවුන්ගෙන් එක් අයෙකුගේ සිනමා කෘති පිළිබඳ විමසීමක් කරන්න.

09. ජර්මන් ප්‍රකාශනවාදී සිනමාවේ ලක්ෂණ මැනවින් ප්‍රකට කරන නිර්මාණයක් ලෙස The Cabinet of Dr. Caligari චිත්‍රපටය හඳුනාගත හැකිය. පහදන්න

***********************